**ජාතික සමාජ සංවර්ධන ආයතනය**
**(ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යාංශය)**

**තනතුර : පරිපාලන නිලධාරි 01**

**1.** වයස් සීමාව : අවුරුදු 22 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන්ට උපරිම වයස් සීමාව අදාළ නොවේ.

**2.** අධ්‍යාපන සුදුසුකම් : **බාහිර අයදුම්කරුවන්**

1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් මානව සම්පත් කළමනාකරණය / වාණිජ/ රාජ්‍ය පරිපාලන/ රාජ්‍ය කළමනාකරණය/ කළමනාකරණය උපාධියක් ලබා තිබීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන් (පහත 1 හෝ 2)**

1. ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම.

2. 'කළමනාකරණ සහකාර - තාක්ෂණික නොවන' (MA 1) සේවා ගණයෙහි II ශ්‍රේණියේ අදාළ ක්ෂේත්‍රයේ තනතුරක අවම වශයෙන් වසර පහක (05) සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

**3.** සම්මුඛ පරීක්ෂණය සඳහා ලකුණු ක්‍රමය :

| | |
|---|---|
| අදාළ අතිරේක පළපුරුද්ද | ලකුණු 30 |
| අදාළ අතිරේක සුදුසුකම් | ලකුණු 30 |
| වෙනත් කුසලතා හා කාර්යසාධනයන් | ලකුණු 15 |
| සම්මුඛ පරීක්ෂණයේදී දක්වන ලද කුසලතාවය | ලකුණු 25 |
| **මුළු ගණන** | **ලකුණු 100** |

**4.** වැටුප් පරිමාණය : JM 1-1 - 2025 – රු. 72,650 - 10 x1,360 – 18x2,040 – රු. 122,970/- 2027.01.01 දින සිට මෙම වැටුප් පරිමාව අදාළ වේ.
(2026 දෙසැම්බර් 31 දක්වා මූලික වැටුප රු. 65,633/- කි.)

**තනතුර : ඉංග්‍රීසි උපදේශක 02**

**1.** වයස් සීමාව : අවුරුදු 22 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි අය විය යුතු ය. අභ්‍යන්තර අයදුම්කරුවන්ට උපරිම වයස් සීමාව අදාළ නොවේ.

**2.** අධ්‍යාපන සුදුසුකම් : **බාහිර අයදුම්කරුවන් (1 හෝ 2 හෝ 3)**

1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ඉංග්‍රීසි ඉගැන්වීම් පිළිබඳ ශාස්ත්‍රවේදී උපාධිය / ඉංග්‍රීසි පිළිබඳ උපාධිය;

*හෝ*

2. තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ලද ජාතික වෘත්තීය කුසලතා (NVQ) හය (06) මට්ටමට නොඅඩු මට්ටමක ඉංග්‍රීසි ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම;

*සහ*

සුදුසුකම් ලබාගැනීමෙන් පසු රජයේ, රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක හෝ ව්‍යවස්ථාපිත ආයතනයක අවම වශයෙන් අදාළ ක්ෂේත්‍රයේ වසර පහක (05) පළපුරුද්දක් ලබා තිබීම.

3. තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ජාතික වෘත්තීය කුසලතා (NVQ) පහ (05) වැනි මට්ටමට නොඅඩු මට්ටමක ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම;

*සහ*

සුදුසුකම් ලබාගැනීමෙන් පසු රජයේ, රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක හෝ ව්‍යවස්ථාපිත ආයතනයක අවම වශයෙන් අදාළ ක්ෂේත්‍රයේ වසර දහයක (10) පළපුරුද්දක් ලබා තිබීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන්**

1. ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම.

**3.** සම්මුඛ පරීක්ෂණය සඳහා ලකුණු ක්‍රමය :

| | |
|---|---|
| අදාළ අතිරේක පළපුරුද්ද | ලකුණු 30 |
| අදාළ අතිරේක සුදුසුකම් | ලකුණු 30 |
| වෙනත් කාර්යසාධනයන් / කුසලතා | ලකුණු 15 |
| සම්මුඛ පරීක්ෂණයේදී දක්වන ලද කුසලතාවය | ලකුණු 25 |
| මුළු ගණන | ලකුණු 100 |

**4.** වැටුප් පරිමාණය : MA 4 - 2025 – රු. 64,320 – 10x1,360 – 15x1,670 – 5x2,040 – රු. 113,170/-
2027.01.01 දින සිට මෙම වැටුප් පරිමාව අදාළ වේ.
2026 දෙසැම්බර් 31 දක්වා මූලික වැටුප රු. 58,598/- කි.)

5. තනතුර සඳහා සේවා නියුක්ත කරවීමේ කොන්දේසි :

**සෑම අයදුම්කරුවෙකුම,**

1. ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතු ය.
2. තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටුකිරීම සඳහා මෙන්ම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍ය වන කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතු ය.
3. රජයේ අනුමත ප්‍රතිශතයන්ට අනුව සේවක අර්ථසාධක අරමුදලට දායක මුදල් (EPF) ගෙවිය යුතු ය.
4. තුන් අවුරුදු පරිවාස කාලයකට යටත් වේ.

**සේවා කොන්දේසි**

1992 අංක 41 දරන ජාතික සමාජ සංවර්ධන ආයතන පනතේ විධිවිධානවලට හා රජය විසින් වරින්වර පනවනු ලබන නීතිරීති හා රෙගුලාසිවලට යටත් විය යුතු ය.

**බඳවාගැනීමේ ක්‍රමවේදය**

පත්වීම් බලධාරියා විසින් නියම කරනු ලබන පරිදි සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය පවත්වනු ලැබේ. ඉහළම ලකුණු ලැබූවන් අතරින් කුසලතා අනුපිළිවෙළ අනුව තෝරාගැනීම සිදු කෙරේ.

අයදුම්කරුවන් සම්පූර්ණ ජීව දත්ත තොරතුරු ඇතුළත් අයදුම්පත් පහත ලිපිනයට 2026.10.16 දින හෝ ඊට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. ඉල්ලුම් කරන තනතුර ලිපි කවරයේ වම්පස ඉහළ කෙළවරේ සඳහන් කළ යුතු ය. අසම්පූර්ණ, අපැහැදිලි හෝ ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරන අතර, එම ඉල්ලුම්පත් ලකුණු ලබාදීමේ නිර්ණායකයන් පදනම් කරගනිමින් කෙටි ලැයිස්තුගත (shortlist) කරනු ලැබේ. (රාජ්‍ය අංශයේ සේවයේ නියුතු නිලධාරීන් තම අයදුම්පත් දෙපාර්තමේන්තු / ආයතන ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතු ය.)

අධ්‍යක්ෂ ජනරාල්,
ජාතික සමාජ සංවර්ධන ආයතනය,

2026 ඔක්තෝබර් මස 02 දින,
ලියනගේමුල්ල,
සීදූව.

10 - 434